# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,925/5 — 1970 සැප්තැම්බර් 30 වැනි බදාදා — 1970.9.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1965 අංක 17 දරණ නිවාඩු පණත

#### 14 (1) (අ) වගන්තිය යටතේ වූ ආඥාව

1965 අංක 17 දරණ නිවාඩු පණතේ 14(1) (අ) වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, ඒ පනතේ දෙවැනි උප ලේඛනයෙහි නිශ්චිතව සඳහන් දිනවලට අතිරේකව, එක්සත් අරාබි සමූහාණ්ඩුවේ ජනාධිපති ගමාල් අබ්දුල් නසාර් තුමාණන්ගේ අභාවය නිමිත්තෙන් 1970 ඔක්තෝබර් පළමු වෙනි දින ඒ පණතේ කාර්‍යයන් සඳහා බැංකු නිවාඩු දිනයක් විය යුතුයයි මේ ආඥාවෙන් ප්‍රකාශ කරමි.

ෆි. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1970 සැප්තැම්බර් මස 30 වෙනි දින,
කොළඹ දීය.

9—237/1

---

### 1965 අංක 17 දරණ නිවාඩු පණත

#### 13 (1) (අ) වගන්තිය යටතේ වූ ආඥාව

1965 අංක 17 දරණ නිවාඩු පණතේ 13(1) (අ) වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, ඒ පනතේ පළමුවැනි උප ලේඛනයෙහි නිශ්චිතව සඳහන් දිනවලට අතිරේකව, එක්සත් අරාබි සමූහාණ්ඩුවේ ජනාධිපති ගමාල් අබ්දුල් නසාර් තුමාණන්ගේ අභාවය නිමිත්තෙන් 1970 ඔක්තෝබර් පළමුවෙනි දින ඒ පණතේ කාර්‍යයන් සඳහා ප්‍රසිධ නිවාඩු දිනයක් විය යුතුයයි මෙ ආඥාවෙන් ප්‍රකාශ කරමි.

ෆි. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1970 සැප්තැම්බර් මස 30 වෙනි දින,
කොළඹ දී ය.

9—237/2

---

### මිල පාලන පණත

(2 වැනි අධිකාරය වන) අර්ථ නිරූපන ආඥාපනතේ 12 වැනි වගන්තිය සමඟ කියවන ලද (173 වැනි අධිකාරය වන) මිළ පාලන පනතේ 2 වැනි වගන්තිය යටතේ විදේශීය හා දේශීය වෙළෙඳ ඇමති තුමා විසින් —

(1) වින්සන්ට් පණ්ඩිත මහතා (විවිධ ද්‍රව්‍ය) නියෝජ්‍ය මිළ පාලක වශයෙන් දැරූ පත්වීම 1970 සැප්තැම්බර් මස 13 වැනි දින සිට අවලංගු කර,

(2) කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ, අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු මහතා සහ බී. සී. ආර්. ජයසිංහ මහතා ඔවුන්ගේ රාජකාරී වලට අමතරව, ඉහතකී දින සිට වලංගු වනසේ මුද්‍ර දිවයින සඳහාම (විවිධ ද්‍රව්‍ය) නියෝජ්‍ය මිළ පාලක වරුන් වශයෙන් පත් කරනු ලැබ සිටී.

ජ. බ. කැලේගම,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

කොළඹ, 1970 සැප්තැම්බර් මස 27 දින.

9—235


722/13—ජේ 17218—11,175 (70/9)

# මිළ පාලන දැන්වීම්

එල්.ඩී.—බී. 131/50

## මිල පාලන පනත

(173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර (විවිධ ද්‍රව්‍ය) නියෝජ්‍ය මිල පාලක, ඉල්ලෙකුට්ටි ඔලිවර් කෙනත් ගාමිණී ප්‍රනාන්දු වන මම පහත සඳහන් පරිදි අණ කරමි.

1. මේ ආඥාව 1970 අංක 1 දරන (දන්තා ලේප ටියුබ්) මිල පාලන ආඥාව යනුවෙන් හැඳින්විය හැකිය.

2. මේ ආඥාව මුළු දිවයිනටම අදාළ විය යුතුය.

3. මේ ආඥාවේ කාර්යයන් සඳහා —

    (1) මෙහි වූ උපලේඛනයේ 1 වැනි හා 2 වැනි තීරයන්හි නියම කොට දක්වා ඇති භාණ්ඩයකින් යම් ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා වෙළෙන්දෙකුට විකිණීම හෝ, ඒ උපලේඛනයේ 1 වැනි හා 2 වැනි තීරයන්හි නියම කොට දක්වා ඇති භාණ්ඩයකින් දුසිම් දෙකකට නොඅඩු යම් ප්‍රමාණයක් එක් වරක විකිණීම තොග වෙළඳාමක් වශයෙන් කැරෙන විකිණීමක් ලෙස සැලකිය යුතුය.

    (2) ඒ උපලේඛනයේ 1 වැනි හා 2 වැනි තීරයන්හි නියම කොට දක්වා ඇති භාණ්ඩයකින් පාරිභෝගය හෝ ප්‍රයෝජනය සඳහා දුසිම් දෙකකට වඩා අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලරට විකිණීමක් ලෙස සැලකිය යුතුය.

4. මෙහි වූ උපලේඛනයේ 3, 4 හා 5 වැනි තීරයන්හි ඇති එක් එක් සටහනෙහි නියම කොට දක්වා ඇති මිල ගණන් 1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට පිළිවෙලින් එක් දන්තාලේප ටියුබ් එකක් සඳහා නිෂ්පාදකයාගේ උපරිම තොග මිල, තොග වෙළෙන්දාගේ උපරිම තොග මිල හා සිල්ලර වෙළෙන්දා පාරිභෝගිකයාගෙන් අය කළ යුතු උපරිම සිල්ලර මිල විය යුතු අතර, ඒ උප ලේඛනයේ 1 වැනි සහ 2 වැනි තීරයන්හි අනුරූප සටහනෙහි විස්තර කොට දක්වා ඇති දන්තාලේප ටියුබ් කිසිවක් ඒ මිල ගණන්වලට වඩා ඉහළ මිල ගණන්වලට නො විකිණිය යුතුය.

5. මෙහි වූ උපලේඛනයේ 1 වැනි හා 2 වැනි තීරයන්හි නියම කොට දක්වා ඇති දන්තාලේප ටියුබ් යම් ප්‍රමාණයක් විකිණීම සඳහා තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින් ඒ දන්තාලේප ටියුබ් වර්ගද, උසින් අඟලකට නොඅඩු ඉලක්කම්වලින්, මේ ආඥාවෙන් ඒ දන්තාලේප ටියුබ් සඳහා නියම කර ඇති උපරිම මිල ද යම් ගනුදෙනුකරුවකුට පැහැදිලිවම පෙනෙන පරිදි දැක්වෙන දැන්වීමක් ඒ ස්ථානයෙහි හෝ ඒ වාහනයෙහි ප්‍රකටව පෙනෙන සේ ප්‍රදර්ශනය කළ යුතුය.

6. මෙහි වූ උපලෙඛනයෙහි 1 වැනි හා 2 වැනි තීරයන්හි දක්වා ඇති යම් දන්තාලේප ටියුබ් තොග වශයෙන් හෝ සිල්ලරට විකුණන සෑම තැනැත්තකු විසින්ම—

    (අ) ඒ විකිණීම ස.ු දිනය,

    (ආ) විකුණු දන්තාලේප ටියුබ් පිළිබඳ විස්තර හා විකුණු ගණන,

    (ඇ) විකුණු දන්තාලේප ටියුබ් ගණන සඳහා අය කළ මිල, හා

    (ඈ) ඒ ගනුදෙනුවේ ස්වභාවය, එනම්, ඒ විකිණීම කරන ලද්දේ තොග වෙළඳාමක් වශයෙන්ද නැතහොත් සිල්ලර වෙළඳාමක් වශයෙන් ද යන වග, දක්වා තිබිය යුතු කුවිතාන්සියක් ගැනුම්කරුට දිය යුතුය.

7. මෙහි වූ උපලේඛනයේ 1 වැනි හා 2 වැනි තීරයන්හි නියම කොට දක්වා ඇති යම් දන්තාලේප ටියුබ් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකිණීමේ ව්‍යාපාරයෙහි යෙදී සිටින සෑම තැනැත්තෙකු විසින්ම, ඒ ව්‍යාපාරය කර ගෙන යනු ලබන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිල පාලක වෙත 1970 ඔක්තෝබර් මස 15 වැනි දින දවල් 12 නො ඉක්මවා පහත සඳහන් කරුණු දැක්වෙන වාර්තාවක් සැපයිය යුතුය :—

    (අ) ඒ වාර්තාව පිළියෙළ කරනු ලබන අවස්ථාවේදී තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ ඇති දන්තාලේප ටියුබ් තොග ප්‍රමාණය, සහ

    (ආ) ඒ තොග තබා ඇති එක් එක් ගබඩාව හෝ සෙසු ස්ථානය.

8. මෙහි ඇති උපලේඛනයේ අංක 3, 4 සහ 5 දරන එක් එක් තීරයෙහි නියම කර දක්වා ඇති උපරිම මිලට, ඒ දන්තාලේප ටියුබ් විකුණන විට ඒවා යම් දවටනයකින් ඔතා තිබේ නම් හෝ ඒවා යම් බඳුනක බහා තිබේ නම්, ඒ දවටනයේ හෝ ඒ බඳුනේ මිල ඇතුළත් විය යුතුය.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
නියෝජ්‍ය මිල පාලක (විවිධ ද්‍රව්‍ය).

1970 සැප්තැම්බර් මස 30 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

### හැකිලිය හැකි ටියුබ්වලින් සැපයෙන දන්තාලේප

| 1<br>විස්තරය | 2<br>ටියුබ් එකක අඩංගු දන්තා ලේපවල අවම ශුද්ධ බර | 3<br>දන්තාලේප ටියුබ් එකක් සඳහා නිෂ්පාදකගේ උපරිම තොග වෙළඳ මිල<br>රු. ශ. | 4<br>දන්තාලේප ටියුබ් එකක් සඳහා තොග වෙළෙන්දාගේ උපරිම වෙළඳ මිල<br>රු. ශ. | 5<br>දන්තාලේප ටියුබ් එකක් සඳහා සිල්ලර වෙළෙන්දාගේ උපරිම මිල<br>රු. ශ. |
|---|---|---|---|---|
| එස්. ආර්. දන්තාලේපය (පිරිමැසුම් ප්‍රමාණය) ... ... | ... අවුන්ස 4.8 ... | 2 12 ... | 2 23 ... | 2 65 |
| එස්. ආර්. දන්තාලේපය (විශාල ප්‍රමාණය) ... ... | ... අවුන්ස 2.8 ... | 1 46 ... | 1 54 ... | 1 85 |
| එස්. ආර්. දන්තාලේපය (මධ්‍යම ප්‍රමාණය) ... ... | ... අවුන්ස 1.7 ... | 1 07 ... | 1 13 ... | 1 35 |
| පෙප්සෝඩන්ට් දන්තාලේපය ... ... ... | ... අවුන්ස 2.8 ... | 1 51 ... | 1 59 ... | 1 90 |
| සිග්නල් දන්තාලේපය (පිරිමැසුම් ප්‍රමාණය) ... ... | ... අවුන්ස 4.8 ... | 2 22 ... | 2 33 ... | 2 80 |
| සිග්නල් දන්තාලේපය (විශාල ප්‍රමාණය) ... ... | ... අවුන්ස 2.8 ... | 1 57 ... | 1 65 ... | 1 95 |
| සිග්නල් දන්තාලේපය (මධ්‍යම ප්‍රමාණය) ... ... | ... අවුන්ස 1.7 ... | 1 12 ... | 1 18 ... | 1 40 |
| ෆෝර්හැන්ස් දන්තාලේපය (පිරිමැසුම් ප්‍රමාණය) ... ... | ... අවුන්ස 5.5 ... | 2 23 ... | 2 34 ... | 2 80 |
| ෆෝර්හැන්ස් දන්තාලේපය (විශාල ප්‍රමාණය) ... ... | ... අවුන්ස 3.5 ... | 1 58 ... | 1 66 ... | 2 0 |
| ෆෝර්හැන්ස් දන්තාලේපය (සම්මත ප්‍රමාණය) ... ... | ... අවුන්ස 1.8 ... | 1 08 ... | 1 14 ... | 1 35 |

සටහන.—මෙකී මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නො වෙනස් මිල ගණන් නොවේ. ඒවා එකී දේ යම් මිල ගණනකට වඩා වැඩියෙන් නො විකිණිය යුතු ද ඒ මිල ගණන්වල උපරිම ප්‍රමාණ විය යුතුය.

9—236/1

එල්.ඩී.—බී. 131/50

## මිල පාලන පනත

(173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර (විවිධ ද්‍රව්‍ය) නියෝජ්‍ය මිල පාලක, ඉල්ලෙකුට්ටි ඔලිවර් කෙනත් ගාමිණි ප්‍රනාන්දු වන මම පහත සඳහන් පරිදි අණ කරමි.

1. මේ ආඥාව 1970 අංක 1 දරන (විදුලි පන්දම් බැටරි සහ ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි) මිල පාලන ආඥාව යනුවෙන් හැඳින්විය හැකිය.

2. මේ ආඥාව මුළු දිවයිනටම අදාළ විය යුතුය.

3. මෙම ආඥාවේ කාර්යයන් සඳහා—

(1) මෙහි වූ උපලේඛනයේ 1 වැනි තීරයෙහි නියම කොට දක්වා ඇති භාණ්ඩයකින් යම් ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා වෙළෙන්දෙකුට විකිණීම හෝ ඒ උප ලේඛනයේ 1 වැනි තීරයෙහි නියම කොට දක්වා ඇති භාණ්ඩයකින් වරකට දුසිම් දෙකකට නොඅඩු යම් ප්‍රමාණයක් විකිණීම හෝ තොග වෙළඳාමක් වශයෙන් කැරෙන විකිණීමක් ලෙස සැලකිය යුතුය.

(2) ඒ උපලේඛනයේ 1 වැනි තීරයෙහි නියම කොට දක්වා ඇති භාණ්ඩයකින් පාරිභෝගය හෝ ප්‍රයෝජනය සඳහා දුසිම් දෙකකට වඩා අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලරට විකිණීමක් ලෙස සැලකිය යුතුය.

4. මෙහි වූ උපලේඛනයේ 2, 3 හා 4 වැනි තීරයන්හි ඇති, එක් එක් සටහනෙහි නියම කොට දක්වා ඇති මිල ගණන් එක් විදුලි පන්දම් බැටරියක් හෝ එක් ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරියක් සඳහා අවස්ථාවෝචිත පරිදි, 1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට, පිළිවෙලින්, නිෂ්පාදකයාගේ උපරිම තොග මිල, තොග වෙළෙන්දගේ උපරිම තොග මිල හා සිල්ලර වෙළෙන්දගේ පාරිභෝගිකයාගෙන් අය කළ යුතු උපරිම සිල්ලර මිල විය යුතු අතර, ඒ උපලේඛනයේ 1 වැනි තීරයේ දනු ?ප සටහනෙහි විස්තර කොට දක්වා ඇති විදුලි පන්දම් බැටරි සහ ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි කිසිවක් ඒ මිල ගණන්වලට වඩා ඉහළ මිළ ගණන්වලට නො විකිණිය යුතුය.

5. මෙහි වූ උපලේඛනයේ 1 වැනි තීරයෙහි නියම කොට දක්වා ඇති විදුලි පන්දම් බැටරි සහ ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ යම් ස්ථානයක හෝ යම් වාහනයක විකිණීම සඳහා තබා ඇති සෑම වෙළෙන්දෙකු විසින් ඒ විදුලි පන්දම් බැටරි සහ ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි වර්ගය ද, උසින් අඟලකට නො අඩු ඉලක්කම්වලින්, මේ ආඥාවෙන් ඒ විදුලි පන්දම් බැටරි සහ ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි සඳහා නියම කර ඇති උපරිම මිල ද යම් ගනුදෙනුකරුවෙකුට පැහැදිලිවම දැකගත හැකි පරිදි දක්වෙන දැන්වීමක් ඒ ස්ථානයෙහි හෝ ඒ වාහනයෙහි ප්‍රකටව පෙනෙන සේ ප්‍රදර්ශනය කළ යුතුය.

6. මෙහි වූ උපලේඛනයෙහි 1 වැනි තීරයෙහි නියම කොට දක්වා ඇති යම් විදුලි පන්දම් බැටරි සහ ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි තොග වශයෙන් හෝ සිල්ලරට විකුණන සෑම තැනැත්තකු විසින් ම—

(අ) ඒ විකිණීම කළ දිනය,

(ආ) විකුණු විදුලි පන්දම් බැටරි සහ ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි පිළිබඳ විස්තරය හා විකුණූ බැටරි ගණන,

(ඇ) විකුණූ බැටරි ගණන සඳහා අය කළ මිල, හා

(ඈ) ඒ ගනුදෙනුවේ ස්වභාවය, එනම්, ඒ විකිණීම කරන ලද්දේ තොග වෙළඳාමක් වශයෙන් ද, නැතහොත් සිල්ලර වෙළඳාමක් වශයෙන්ද යන වග, දක්වා තිබිය යුතු කුවිතාන්සියක් ගැනුම්කරුට දිය යුතුය.

7. මෙහි වූ උපලේඛනයේ 1 වැනි තීරයෙහි නියම කොට දක්වා ඇති යම් විදුලි පන්දම් බැටරි සහ ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි තොග හෝ සිල්ලර වෙළෙන්දකු වශයෙන් ව්‍යාපාරයෙහි යෙදී සිටින සෑම තැනැත්තෙකු විසින්, ඒ ව්‍යාපාරය කරගෙන යනු ලබන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිල පාලක වෙත 1970 ඔක්තෝබර් 15 වෙනි දින දවල් 12 නො ඉක්මවා පහත සඳහන් කරුණු දක්වෙන වාර්තාවක් සැපයිය යුතුය :—

(අ) ඒ වාර්තාව පිළියෙළ කරනු ලබන අවස්ථාවේදී තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ ඇති විදුලි පන්දම් බැටරි සහ ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි තොග ප්‍රමාණය, සහ

(ආ) ඒ තොග තබා ඇති එක් එක් ගබඩාව හෝ සෙසු ස්ථානය, තව ද,

8. මෙහි වූ උපලේඛනයේ අංක 2, 3 සහ 4 දරන එක් එක් තීරයෙහි නියම කර දක්වා ඇති උපරිම මිලට, ඒ විදුලි පන්දම් සහ ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි විකුණන විට ඒවා යම් දෙයකින් ඔතා තිබෙ නම්, හෝ ඒවා යම් බඳුනක බහා තිබෙ නම්, ඒ ඔතනයේ හෝ ඒ බඳුනේ මිල ඇතුළත් විය යුතුය.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
නියෝජ්‍ය මිල පාලක (විවිධ ද්‍රව්‍ය).

1970 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

### විදුලි පන්දම් බැටරි සහ ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි

| 1 තීරය<br>වර්ගය<br>උස අඟල් 2.38 ට නොඅඩු හා අඟල් 2.45 ට නොවැඩි ද විෂ්කම්භය අඟල් 1.2 ට නොඅඩු හා අඟල් 1.26 ට නොවැඩි විදුලි පන්දම් බැටරි | 2 තීරය<br>බැටරි එකක් සඳහා නිෂ්පාදකයාගේ උපරිම තොග මිල<br>ශත | 3 තීරය<br>බැටරි එකක් සඳහා තොග වෙළෙන්දගේ උපරිම තොග මිල<br>ශත | 4 තීරය<br>බැටරි එකක් සඳහා සිල්ලර වෙළෙන්දගේ උපරිම සිල්ලර මිල<br>ශත |
|---|---|---|---|
| එවරෙඩි—සාමාන්‍ය විදුලි පන්දම් බැටරි ... ... ... | 52 ... | 55 ... | 60 |
| බෙරෙක් යූ 2—විදුලි පන්දම් බැටරි ... ... ... | 52 ... | 55 ... | 60 |
| ලක්ෂපාන—යූ. එම්. 2 විදුලි පන්දම් බැටරි ... ... ... | 52 ... | 55 ... | 60 |
| ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි— | | | |
| උස—අඟල් 2.38 නොඅඩු හා අඟල් 2.45 ට නොවැඩි | | | |
| විෂ්කම්භය—අඟල් 1.2 ට නොඅඩු හා අඟල් 1.26 ට නොවැඩි ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි | | | |
| එවරෙඩි—සාමාන්‍ය ට්‍රාන්සිස්ටර් බැටරි ... ... ... | 55 ... | 58 ... | 63 |
| බෙරෙක්—පී. පී. 12 ට්‍රාන්සිස්ටර් බැටරි ... ... ... | 55 ... | 58 ... | 63 |

එල්. ඩී. — බී. 131/50

## මිල පාලන පනත

(173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර (විවිධ ද්‍රව්‍ය) නියෝජ්‍ය මිල පාලක, ඉල්ලෙ කුට්ටි ඔලිවර් කෙනත් ගාමිණී ප්‍රනාන් ප්‍රනාන්දු වන මම පහත සඳහන් පරිදි අණ කරමි.

1. මේ ආඥාව 1970 අංක 1 දරණ (කුඩ) මිල පාලන ආඥාව යනුවෙන් හැඳින්විය හැකිය.

2. මේ ආඥාව මුළු දිවයිනටම අදාළ විය යුතුය.

3. මේ ආඥාවෙහි කාර්යයන් සඳහා—

(1) මෙයට යාකොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩයකින් යම් ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා වෙළෙන්දෙකුට විකිණීම හෝ ඒ උප ලේඛනයේ 1 වැනි තීරයෙහි නිශ්චිත ව දක්වා ඇති භාණ්ඩයකින් වරකට දුසිමකට නොඅඩු යම් ප්‍රමාණයක් විකිණීම තොග වෙළඳාමක් වශයෙන් කැරෙන විකිණීමක් ලෙස සැලකිය යුතුය, තවද

(2) ඒ උපලේඛනයේ 1 වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩයකින් පාරිභෝගය හෝ ප්‍රයෝජනය සඳහා දුසිම් එකකට වඩා අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලරට විකිණීමක් ලෙස සැලකිය යුතුය.

4. මෙයට යාකොට ඇති උප ලේඛනයේ 2, 3 හා 4 වැනි තීරයන්හි ඇති එක් එක් සටහනෙහි නිශ්චිතව දක්වා ඇති මිල ගණන් 1970 ඔක්තෝබර් මස 1 දින සිට පිළිවෙලින් නිෂ්පාදකයාගේ උපරිම තොග මිල, තොග වෙළෙන්දගේ උපරිම තොග මිල හා සිල්ලර වෙළෙන්ද පාරිභෝගිකයාගෙන් අය කළ යුතු උපරිම සිල්ලර මිල විය යුතු අතර, ඒ උපලේඛනයේ 1 වැනි තීරයේ අනුරූප සටහනෙහි විස්තර කොට දක්වා ඇති කුඩ කිසිවක් ඒ මිල ගණන්වලට වඩා ඉහළ මිල ගණන්වලට නො විකිණිය යුතුය.

5. මෙයට යාකොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයෙහි විස්තර කොට දක්වා ඇති කුඩ තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ යම් ස්ථානයක හෝ යම් වාහනයක විකිණීම සඳහා ඇති සෑම වෙළෙන්දෙකු විසින්ම, ඒ කුඩ වර්ගය ද උසින් අඟලකට නොඅඩු ඉලක්කම්වලින් මේ ආඥාවෙන් ඒ කුඩ සඳහා නියම කර ඇති උපරිම මිලද යම් ගනුදෙනුකරුවෙකුට පැහැදිලිව ම දක ගත හැකි පරිදි දක්විය යුතු දන්වීමක් ඒ ස්ථානයෙහි හෝ ඒ වාහනයෙහි ප්‍රකටව පෙනෙන සේ ප්‍රදර්ශනය කළ යුතුය.

6. මෙයට යාකොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයෙහි විස්තර කොට දක්වා ඇති කුඩ කිසිවක් තොග වශයෙන් හෝ සිල්ලරට විකුණන සෑම තැනැත්තකු විසින්ම—

(අ) ඒ විකිණීම කළ දිනය,

(ආ) විකුණූ කුඩ පිළිබඳ විස්තර හා විකුණූ ගණන,

(ඇ) විකුණූ කුඩ ගණන සඳහා අය කළ මිල, හා

(ඈ) ඒ ගනුදෙනුවේ ස්වභාවය, එනම්, ඒ විකිණීම කරන ලද්දේ තොග වෙළෙඳාමක් වශයෙන් ද, නැතහොත් සිල්ලර වෙළෙඳාමක් වශයෙන් ද යන වග දක්වා තිබිය යුතු කුවිතාන්සියක් ගැනුම්කරුට දිය යුතුය.

7. මෙයට යාකොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයෙහි විස්තර කොට දක්වා ඇති යම් කුඩ තොග හෝ සිල්ලර වෙළෙන්දෙකු වශයෙන් ව්‍යාපාරයෙහි යෙදී සිටින සෑම තැනැත්තකු විසින්ම, ඒ ව්‍යාපාරය කර ගෙන යනු ලබන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිල පාලක වෙත 1970 ඔක්තෝබර් 15 වැනි දින දවල් 12 නොඉක්මවා පහත සඳහන් කරුණු දක්වෙන වාර්තාවක් සැපයිය යුතුය :—

(අ) ඒ වාර්තාව පිළියෙල කරනු ලබන අවස්ථාවේදී තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ ඇති කුඩ තොග ප්‍රමාණය,

(ආ) ඒ තොග තබා ඇති එක් එක් ගබඩාව හෝ සෙසු ස්ථානය.

8. මෙයට යාකොට ඇති උපලේඛනයේ අංක 2, 3 හා 4 දරන එක් එක් තීරයෙහි නිශ්චිතව දක්වා ඇති උපරිම මිලට, ඒ කුඩ විකුණන විට ඒවා යම් දෙයකින් ඔතා තිබෙ නම් හෝ ඒවා යම් බඳුනක බහා තිබෙ නම්, ඒ ඔතනයේ හෝ ඒ බඳුනේ මිල ඇතුලත් විය යුතු ය.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
නියෝජ්‍ය මිල පාලක (විවිධ ද්‍රව්‍ය).

1970 සැප්තැම්බර් මස 30 දින,
කොළඹ දී ය.

### උප ලේඛනය

### කුඩ

| 1 වැනි තීරය<br>විස්තරය | 2 තීරය<br>නිෂ්පාදකයාගේ උපරිම තොග මිල එක් කුඩයක් සඳහා<br>රු. ශ. | 3 තීරය<br>තොග වෙළෙන්දාගේ උපරිම තොග මිල එක් කුඩයක් සඳහා<br>රු. ශ. | 4 තීරය<br>සිල්ලර වෙළෙන්දාගේ උපරිම සිල්ලර මිල එක් කුඩයක් සඳහා<br>රු. ශ. |
|---|---|---|---|
| 23″ ට නො අඩුවූද, 26″ ට නොවැඩිවූද, නන ඇතිව එක්සත් රාජධානියේ සාදන ලද රෙදි හා මෙරට හෝ ආනයනය කරන ලද වෙනත් ද්‍රව්‍ය යොදා ලංකාවේ නිෂ්පාදනය කළ කුඩයක් ... | 20 50 ... | 21 50 ... | 23 0 |
| 17″ ට නො අඩුවූද, 22″ ට නොවැඩිවූද, නන ඇතිව, එක්සත් රාජධානියේ සාදන ලද රෙදි හා මෙරට හෝ ආනයනය කරන ලද වෙනත් ද්‍රව්‍ය යොදා ලංකාවේ නිෂ්පාදනය කළ කුඩ ... | 16 70 ... | 17 50 ... | 19 0 |
| 23″ ට නොඅඩුවූද, 26″ ට නොවැඩිවූද, නන ඇතිව එක්සත් ජාරධානියේ හැර වෙනයම් රටක සාදන ලද රෙදි හා වෙනත් මෙරට හෝ ආනයනය කරන ලද වෙනත් ද්‍රව්‍ය යොදා ලංකාවේ නිෂ්පාදනය කළ කුඩ ... ... ... ... ... | 16 20 ... | 17 0 ... | 18 0 |
| 17″ ට නොඅඩුවූද, 22″ ට නොවැඩිවූද, නන ඇතිව එක්සත් රාජධානියේ හැර වෙන යම් රටක සාදන ලද රෙදි හා වෙනත් මෙරට හෝ ආනයනය කරන ලද වෙනත් ද්‍රව්‍ය යොදා ලංකාවේ නිෂ්පාදනය කළ කුඩ ... ... ... ... ... | 13 70 ... | 14 50 ... | 16 0 |

සටහන.—මේ මිල ගණන් ඉහත සඳහන් භාණ්ඩ විකිණිය යුතු නියමිත මිල ගණන් නොවේ. මේ මිල ගණන් උපරිම මිල ගණන් වන අතර, මේ උපරිම මිල ගණන්වලට වඩා ඉහළ මිල ගණන්වලට ඒ භාණ්ඩ නො විකිණිය යුතු ය.

9–236/3

එල්. ඩී.–බී. 131/50

## මිල පාලන පනත

(173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර (විවිධ ද්‍රව්‍ය) නියෝජ්‍ය මිල පාලක, ඉල්ලෙ කුට්ටි ඔලිවර් කෙනත් ගාමිණී ප්‍රනාන්දු වන මම පහත සඳහන් පරිදි අණ කරමි.

1. මේ ආඥාව 1970 අංක 1 දරණ (බයිසිකල් ටයර් හා ටියුබ) මිල පාලන ආඥාව යනුවෙන් හැඳින්විය හැකිය.
2. මේ ආඥාව මුළු දිවයිනටම අදාල විය යුතුය.
3. මේ ආඥාවේ කාර්යයන් සඳහා—

   (1) මෙයට යාකොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩයකින් යම් ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා වෙලෙන්දෙකුට විකිණීම හෝ ඒ උපලේඛනයේ 1 වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩයකින් වරකට දුසිමකට නො අඩු යම් ප්‍රමාණයක් විකිණීම තොග වෙළඳමක් වශයෙන් කැරෙන විකිණීමක් ලෙස සැලකිය යුතු ය, තවද

   (2) ඒ උපලේඛනයේ 1 වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩයකින් පාරිභෝගය හෝ ප්‍රයෝජනය සඳහා දුසිම් එකකට වඩා අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලරට විකිණීමක් ලෙස සැලකිය යුතු ය.

4. මෙයට යාකොට ඇති උපලේඛනයේ 2, 3 හා 4 වැනි තීරයන්හි ඇති එක් එක් සටහනෙහි නිශ්චිතව දක්වා ඇති මිල ගණන් 1970 ඔක්තෝබර් මස 1 වැනිද සිට අවස්ථාවෝචිත පරිදි පිළිවෙලින් බයිසිකල් ටයර් එකක හෝ බයිසිකල් ටියුබ එකක නිෂ්පාදකයාගේ උපරිම තොග මිල, තොග වෙළෙන්දාගේ උපරිම තොග මිල හා සිල්ලර වෙළෙන්ද පාරිභෝගිකයාගෙන් අය කළ යුතු උපරිම සිල්ලර මිල විය යුතු අතර, ඒ උපලේඛනයේ 1 වැනි තීරයේ අනුරූප සටහනෙහි විස්තර කොට දක්වා ඇති බයිසිකල් ටයර් හා බයිසිකල් ටියුබ කිසිවක් ඒ මිල ගණන්වලට වඩා ඉහළ මිල ගණන්වලට නො විකිණිය යුතු ය.

5. මෙයට යාකොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයෙහි විස්තර කොට දක්වා ඇති බයිසිකල් ටයර් හෝ බයිසිකල් ටියුබ තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ යම් ස්ථානයක හෝ යම් වාහනයක විකිණීම සඳහා ඇති සැම වෙළෙන්දෙකු විසින්ම, ඒ බයිසිකල් ටයර් හෝ බයිසිකල් ටියුබවල වර්ගය ද උසින් අඟලකට නො අඩු ඉලක්කම්වලින් මේ ආඥාවෙන් ඒ බයිසිකල් ටයර් හෝ බයිසිකල් ටියුබ සඳහා නියම කර ඇති උපරිම මිල ද යම් ගනුදෙනුකරුවෙකුට පැහැදිලිවම දක ගත හැකි පරිදි දක්විය යුතු දැන්වීමක් ඒ ස්ථානයෙහි හෝ ඒ වාහනයෙහි ප්‍රකටව පෙනෙන සේ ප්‍රදර්ශනය කළ යුතු ය.

6. මෙයට යාකොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයෙහි විස්තර කොට ඇති දක්වා යම් බයිසිකල් ටයර් හා බයිසිකල් ටියුබ තොග වශයෙන් හෝ සිල්ලරට විකුණන සැම තැනැත්තකු විසින්ම—

   (අ) ඒ විකිණීම කළ දිනය,

   (ආ) විකුණූ බයිසිකල් ටයර් හා ටියුබ පිළිබඳ විස්තරය හා විකුණූ ගණන,

   (ඇ) විකුණූ ගණන සඳහා අය කළ මිල, හා

   (ඈ) ඒ ගනුදෙනුවේ ස්වභාවය, එනම්, ඒ විකිණීම කරන ලද්දේ තොග වෙළෙඳාමක් වශයෙන්ද, නැතහොත් සිල්ලර වෙළෙඳමක් වශයෙන් ද යන වග,

   දක්වා තිබිය යුතු කුවිතාන්සියක් ගැනුම්කරුට දිය යුතු ය.

7. මෙයට යාකොට ඇති උපලේඛනයේ 1 වැනි තීරයෙහි විස්තර කොට දක්වා ඇති යම් බයිසිකල් ටයර් හා බයිසිකල් ටියුබ තොග හෝ සිල්ලර වෙළෙන්දෙකු වශයෙන් ව්‍යාපාරයෙහි යෙදී සිටින සැම තැනැත්තෙකු විසින්ම, ඒ ව්‍යාපාරය කර ගෙන යනු ලබන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිල පාලක වෙත 1970 ඔක්තෝබර් මස 15 වෙනි දින දවල් 12 නොඉක්මවා පහත සඳහන් කරුණු දක්වෙන වාර්තාවක් සැපයිය යුතුය :—

   (අ) ඒ වාර්තාව පිළියෙළ කරනු ලබන අවස්ථාවේදී තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ ඇති බයිසිකල් ටයර් හා බයිසිකල් ටියුබ තොග ප්‍රමාණය, සහ

   (ආ) ඒ තොග තබා ඇති එක් එක් ගබඩාව හෝ සෙසු ස්ථානය.

8. මෙයට යාකොට ඇති උපලේඛනයේ අංක 2, 3 සහ 4 දරණ එක් එක් තීරයෙහි නිශ්චිතව දක්වා ඇති උපරිම මිලට, ඒ බයිසිකල් ටයර් හා බයිසිකල් ටියුබ විකුණන විට ඒවා යම් දෙයකින් ඔතා තිබෙ නම් හෝ ඒවා යම් බඳුනක බහා තිබෙ නම්, ඒ ඔතනයේ හෝ ඒ බඳුනේ මිල ඇතුළත් විය යුතු ය.

1970 සැප්තැම්බර් 30 දින,
කොළඹදී ය

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
නියෝජ්‍ය මිල පාලක (විවිධ ද්‍රව්‍ය).

### උපලේඛනය

## බයිසිකල් ටයර් සහ බයිසිකල් ටියුබ

| 1 තීරය<br>වර්ගය | 2 තීරය<br>නිෂ්පාදකයාගේ<br>උපරිම තොග මිල<br>රු. ශ. | 3 තීරය<br>තොග වෙළෙන්දාගේ<br>උපරිම තොග මිල<br>රු. ශ. | 4 තීරය<br>සිල්ලර වෙළෙන්දාගේ<br>උපරිම සිල්ලර මිල<br>රු. ශ. |
|---|---|---|---|
| ලෝටස් ස්ටෑන්ඩඩ් බයිසිකල් ටයර්<br>ප්‍රමාණයන්—28″ × 1 1/2″<br>24″ × 1 3/8″<br>26″ × 1 3/8″ | ... ටයර් එකක් 5 35 | ... ටයර් එකක් 5 50 | ... ටයර් එකක් 6 0 |
| ලෝටස් හෙවි ඩියුටි බයිසිකල් ටයර්<br>ප්‍රමාණයන්—28″ × 1 1/2<br>20″ × 2 × 1 1¾″ | ... ටයර් එකක් 7 15 | ... ටයර් එකක් 7 40 | ... ටයර් එකක් 8 0 |
| 26″ × 1 1¾″ | ... ටයර් එකක් 8 15 | ... ටයර් එකක් 8 40 | ... ටයර් එකක් 9 0 |
| ලෝටස් බයිසිකල් ටියුබ<br>ප්‍රමාණයන්—24″ × 1 3/8″<br>26″ × 1 3/8″<br>28″ × 1 1/2″ | ... ටියුබ එකක් 2 30 | ... ටියුබ එකක් 2 35 | ... ටියුබ එකක් 2 50 |
| ලෝටස් ස්ටෑන්ඩඩ් බයිසිකල් ටියුබ<br>ප්‍රමාණයන්—20″ × 2 × 1 ¾″<br>26″ × 1¾″ | ... ටියුබ එකක් 2 50 | ... ටියුබ එකක් 2 55 | ... ටියුබ එකක් 2 75 |
| ලෝටස් මුට්ට රත්ත බයිසිකල් ටියුබ<br>ප්‍රමාණයන්—28″ × 1 1/2″ — | ... ටියුබ එකක් 3 25 | ... ටියුබ එකක් 3 30 | ... ටියුබ එකක් 3 50 |
| සින්වා බයිසිකල් ටයර්<br>ප්‍රමාණයන්—28″ × 1 1/2″<br>26″ × 1 3/8″ | ... ටයර් එකක් 6 25 | ... ටයර් එකක් 6 40 | ... ටයර් එකක් 6 90 |
| සින්වා බයිසිකල් ටියුබ<br>ප්‍රමාණයන්—28″ × 1 1/2″<br>26″ × 1 3/8″ | ... ටියුබ එකක් 2 30 | ... ටියුබ එකක් 2 35 | ... ටියුබ එකක් 2 50 |

සටහන.—මෙකී මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නොවෙනස් මිල ගණන් නොවේ. ඒවා එකී දේ යම් මිල ගණනකට වඩා වැඩියෙන් නොවිකිණිය යුතු ද ඒ මිල ගණන්වල උපරිම ප්‍රමාණ විය යුතුය.

9-230/1

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී